# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2017/05 – 2017 මැයි 02 වැනි අඟහරුවාදා – 2017.05.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කොටපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොරවක් කෝරළේ සුළු කොට්ඨාසයේ, මතුගොබේ (අ.ග.පි. 169) ගමේ පිහිටි, මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක එම්ආර්/කේටීපී/2017/34 හා 2017.02.28 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 1.5524 ක් වන කැබලි අක්ෂර 'බී' වශයෙන් දක්වා ඇති ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'බී' – දෙනියාය වත්ත, හැන්ඩ්පර්ඩ් කොටස (ක්ෂේත්‍ර අංක 08) – ප්‍රමාණය: හෙක්. 1.5524**

උතුරට: සී/ස තලවකැලේ වතුසමාගම හිමිකම් කියන හැන්ඩ්පර්ඩ් හංසවිලා ගම්මානය; නැගෙනහිරට: සී/ස තලවකැලේ වතුසමාගම හිමිකම් කියන හැන්ඩ්පර්ඩ් හංසවිලා ගම්මානය, මාර්ගය (මා.සං.අ.) සහ සී/ස තලවකැලේ වතුසමාගම හිමිකම් කියන සිරි සදහම් විහාර භූමිය; දකුණට: මාර්ගය (මා.සං.අ.) සහ සී/ස තලවකැලේ වතුසමාගම හිමිකම් කියන සිරි සදහම් විහාර භූමිය; බටහිරට: සී/ස තලවකැලේ වතුසමාගම හිමිකම් කියන සිරි සදහම් විහාර භූමිය සහ කැබලි අක්ෂර ඒ.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/15/2014/වීඊ/308.
2017 අප්‍රේල් මස 05 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

05 – 438

1A – G25496 – 22 (2017/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.